T C

...හිමිකම් ඇවිරිණි
...eserved

# Royal College - Colombo 07
# රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 33 | S | I |
|---|---|---|

## Grade 11 – Second Term Test – October 2023

කාලය : පැය 1
Time: 1 hour

දෙවන වාර පරීක්ෂණය - 2023 ඔක්තෝබර් - 11 ශ්‍රේණිය

## ඉතිහාසය - I

........................................................................... Class: -.................. Index no: - ........................

...පුතුයි.
...ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
... 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ...ලපෙන හෝ පිළිතුර තෝරන්න.
... සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් ...තුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

...ට ශාසන ඉතිහාසයට මුල්තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,
...රාජාවලියයි (2) විනයට්ඨකතාවයි (3) නිකාය සංග්‍රහයයි (4) දාඨා වංසයයි

...ත ප්‍රජාව විසින් විවිධ කාල වකවානුවල දී ලියන ලද ග්‍රන්ථ හෝ ලේඛන හඳුන්වනු ලබන්නේ,
...පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය නමිනි. (2) සාහිත්‍ය මූලාශ්‍රය නමිනි.
...ඓතිහාසික ග්‍රන්ථ නමිනි. (4) සෙල්ලිපි නමිනි.

... ඓතිහාසික මානවයා වෙරළබඩ ප්‍රදේශ සමඟ සබඳතා පැවැත්වූ බවට තොරතුරු ලබා දෙන ...නයක් වන්නේ,
...අලිගල ලෙන (2) පොතාන ලෙන
...අත්තනගොඩ අලු ලෙන (4) කිතුල්ගල බෙලි ලෙන

...පූ. 1129 තරම් ඈත කාලවකවානුවකදී කාන්තාවන් විසින් ඇස් පිහාටු වර්ණ ගැන්වීමට භාවිත ...ා ලද ලෝහ කූරක් හමු වූයේ,
...උඩරංචාමඩමෙන් ය. (2) හල්දුම්මුල්ලෙන් ය.
...රුවන්වැල්ල නිකවලමුල්ලෙන් ය. (4) ඉබ්බන්කටුව සුසාන භූමියෙන් ය.

...කතාවල සඳහන් පරිදි විවිධ වෘත්තිකයන් විසූ පහත සඳහන් ගම් II තීරුවේ සඳහන් තොරතුරු ...ා නිවැරදිව ගලපා පිළිතුර තෝරන්න.

| I | II |
|---|---|
| කසීකාරගාම | A. ධීවරයන් විසූ ගම් |
| කුම්භකාරගාම | B. ගොවියන් විසූ ගම් |
| ගෝපාලගාම | C. වළං සාදන්නන් විසූ ගම් |
| කේවට්ටගාම | D. මැණික් කැපූ අය විසූ ගම් |
| | E. ගොපල්ලන් විසූ ගම් |

...B,C,E,A (2) B,C,B,A (3) A,B,C,D (4) C,D,E,B

...කාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශවල සිදු වූ බව ...ා පුරාවිද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංගා නිම්නයක් වන්නේ කුමක්ද ?
...ළා ඔය (2) යාන් ඔය (3) ගල් ඔය (4) කිරිඳි ඔය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

07. පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියෙක් ඊළඟ කන්නයේ ලබා දෙන පොරොන්දුව මත ඒ ගමේ විශ්‍රාමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවත සඳහන් වන මූලාශ්‍රය කුමක්ද ?
(1) සද්ධර්මරත්නාවලිය (2) සද්ධර්මාලංකාරය
(3) රාජාවලිය (4) ජාතකට්ඨකතාව

08. • දේශපාලන බලය මධ්‍යගත කිරීම.
• ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීම.
• දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත්කිරීම.
• වාරි කර්මාන්ත රාශියක් කරවීම.

ඉහත තොරතුරු වලට සම්බන්ධ රජු,
(1) පළමුවන අග්බෝ ය. (2) ධාතුසේන ය. (3) වසභ ය. (4) මහසෙන් ය.

09. විහාර ආරාමවලට කරන ලද පූජාවන් ගැන තොරතුරු ඇතුළත් ශිලාලිපිවල විවිධ සංකේත භාවිත කර ඇත. එහි වටාපතින් නිරූපණය කෙරෙන සංකේතයෙන් හැඟවෙන්නේ කුමක්ද ?
(1) පාරිශුද්ධත්වය (2) රාජකීයත්වය (3) සෞභාග්‍යය (4) ආරක්ෂාව

10. • නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම.
• වැව්වලින් ගොවිතැන් කරන කුඹුරුවල වී මිස මුං වැපිරීම නොකළ යුතුය.

කෘෂිකාර්මික කටයුතු සම්බන්ධව ඉහත සඳහන් නීති ඇතුළත් සෙල්ලිපි දෙක පිළිවෙළින් සඳහන් වන පිළිතුර තෝරන්න.
(1) බදුලු ටැම් ලිපිය, වෙස්සගිරිය සෙල්ලිපිය
(2) වෙස්සගිරිය සෙල්ලිපිය, කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය
(3) මුතුගල්ල සෙල්ලිපිය, බදුලු ටැම් ලිපිය
(4) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය, වෙස්සගිරිය සෙල්ලිපිය

11. ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික මෙන්ම විවිධ සංස්කෘතීන්ට අයත් රටක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
(1) සෞම්‍ය දේශගුණයක් තිබීමය. (2) දූපතක් වශයෙන් පිහිටීමය.
(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීමය. (4) ස්වභාවික සම්පත් බහුල රටක් වීමය.

12. අභයගිරිය විහාරයේ කැණීම් කටයුතුවල දී "රන් දෙවිසි කළඳ" යනුවෙන් සඳහන් කළ රන් කැබැල්ලක් හමුවීම තුළින් හෙළිවන කරුණ කුමක්ද ?
(1) එම යුගයේ පැවති ආර්ථික සමෘද්ධිමත් බවය.
(2) අතීතයේ පැවති ලෝහ තාක්ෂණය ය.
(3) විනිමය කටයුතු වලදී කාසි වෙනුවට ලෝහ බරද වටිනාකමක් ලෙස භාවිත කළ බව ය.
(4) අතීතයේ වෙළඳ කටයුතුවලදී කාසි භාවිත කළ බව ය.

13. අතීතයේ මෙරට අපරාධ නීතිය සම්බන්ධව පුළුල් විස්තර ඇතුළත් වේවැල්කැටිය සෙල්ලිපිය කරවන ලද්දේ,
(1) නිශ්ශංකමල්ල රජු ය. (2) හතරවන මිහිඳු රජු ය.
(3) හතරවන උදය රජු ය. (4) පස්වන මිහිඳු රජු ය.

14. ඉතා සියුම් බෑස්මක් සහිත ඇළ මාර්ග ඉදිකිරීමට අපේ අතීත වාරි ශිල්පීන් සතුව පැවති කුසලතාව විදහාපාන කදිම නිදසුන මින් කුමක් ද ?
(1) යෝධ ඇළ (2) මිණිපේ ඇළ
(3) ඇළහැර ඇළ (4) අංගමැඩිල්ල ඇළ

• **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
A. කාළිංගරායරගේ ආක්‍රමණය
B. චන්ද්‍රභානු ජාවකගේ ආක්‍රමණය
C. පන්සියපනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
D. සිංහල සංගෙ නම් කැරැල්ල ඇතිවීම.
E. සපුමල් කුමරු යාපනය යටත් කර ගැනීම.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

15. දඹදෙණි රාජධානි සමයේ සිදුවීම් පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) A සහ B (2) C සහ D (3) B සහ C (4) A සහ E

16. කෝට්ටේ රාජධානි සමයට අයත් සිදුවීම් සහිත පිළිතුර තෝරන්න.
(1) C සහ D (2) C සහ E (3) D සහ E (4) A සහ D

17. ගම්පොළ රාජධානි සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ,
(1) හින්දු හා මහායාන බලපෑම නිසා පිළිමගෙවල්වල දේවාල ඉදිකිරීමය.
(2) ඉබන් බතූතා ශ්‍රී පාදය වන්දනා කිරීම ය.
(3) රාජ්‍ය උරුමය එකම රාජකීය පවුලක පියපුතු ක්‍රමයට හිමි වීම ය.
(4) මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුමවීමේ ක්‍රමයක් ආරම්භ වීමය.

18. යාපහුව රාජධානියේ පියගැටපෙළ හා කුළුණු නිර්මාණය සඳහා ආභාසය ලබා ගත් රටවල් වන්නේ,
(1) දකුණු ඉන්දියාව සහ කාම්බෝජය (2) පාණ්ඩ්‍ය හා කාම්බෝජය
(3) බුරුමය හා කාම්බෝජය (4) පාණ්ඩ්‍ය හා බුරුමය

19. පෘතුගීසීන් සමඟ කළ සටන් සම්බන්ධයෙන් පහත දැක්වෙන යුගල අතරින් නොගැළපෙන පිළිතුර තෝරන්න.
(1) අපොන්සු පෙරෙයිරා ද ලසර්දා - බලන සටන
(2) ජෙරෝ ලෝපෙස් ද සූසා - දන්තුරේ සටන
(3) දියෝගෝ ද මෙලෝ - ගන්නෝරුව සටන
(4) කොන්ස්තන්තීනු ද සා - රන්දෙණිවල සටන

20. හයවන විජයබාහු රජු මරණයට පත්කරන ලද්දේ කවරෙකු විසින් ද ?
(1) සුලෙයිමාන් (2) සලමාන් (3) සැමොරින් (4) සංකිලි

21. උපසම්පදාව ගෙනඒම වැනි ආගමික කටයුතුවලට ලන්දේසීහු විසින් නැව් සපයා දුන් උඩරට රජවරුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) සෙනරත් රජු, පළමුවන විමලධර්මසූරිය රජු, විජය රාජසිංහ රජු
(2) දෙවන රාජසිංහ රජු, රාජාධිරාජසිංහ රජු, සෙනරත් රජු
(3) දෙවන විමලධර්මසූරිය රජු, විජය රාජසිංහ රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(4) පළමුවන විමලධර්මසූරිය රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

22. ක්‍රි.ව. 1664 සිට ප්‍රංශවරුන් විසින් ඉන්දියාවේ වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවා ගත් ස්ථාන දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) මද්‍රාසිය, කරිකාල්, බොම්බාය (2) මද්‍රාසිය, කල්කටා, බොම්බාය
(3) පොන්ඩිචෙරි, කරිකාල්, චන්ද්‍රනගර් (4) කල්කටා, කරිකාල්, චන්ද්‍රනගර්

• දී ඇති වගුවේ A සිට J තෙක් තොරතුරු ඇසුරින් 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | පුද්ගල නාම | ආණ්ඩුකාරවරු |
|---|---|---|
| A. 1803 | D. කැප්පෙටිපොළ | G. ෆ්‍රෙඩ්රික් නෝර්ත් |
| B. 1815 | E. පුරන් අප්පු | H. රොබට් බ්‍රවුන්රිග් |
| C. 1818 | F. මැක්ඩොවල් | J. තෝමස් මෙට්ලන්ඩ් |

23. ඉංග්‍රීසීන්ගේ උඩරට ප්‍රථම ආක්‍රමණය පිළිබඳව අදාළ වන තොරතුරු ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A,D,G (2) B,E,H (3) A,F,G (4) C,F,J

24. උඩරට ගිවිසුම සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) C,D,H (2) B,D,H (3) C,F,J (4) B,E,G



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

25. ක්‍රි.ව. 1848 නිදහස් අරගලයට බලපෑ ටොරින්ටන් ආණ්ඩුකාරවරයා විසින් පනවන ලද බදු වර්ග පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද ?
(1) පොල්ගස් බද්ද, පුනු බද්ද, බලු බද්ද, දුම්කොළ බද්ද
(2) තුවක්කු බද්ද, ඇඟ බද්ද, පොල්ගස් බද්ද, පුනු බද්ද
(3) වෙළඳසැල් බද්ද, බලු බද්ද, දුම්කොළ බද්ද, පුනු බද්ද
(4) මුද්දර බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද, වෙළඳසැල් බද්ද

26. ඉංග්‍රීසි ආණ්ඩුව හා මහජනතාව අතර සබඳතා දුරස්වීමට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යෝජනාව කුමක්ද ?
(1) නව අධිකරණයක් ආරම්භ කිරීම.
(2) සිවිල් සේවකයන් සංඛ්‍යාව අඩු කිරීම.
(3) ගමේ පොදු කටයුතු සිදු කළ ගම් සභාව අහෝසි කිරීම.
(4) ජනතාවගේ ඉඩම් රජයට පවරා ගැනීම.

27. පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශ අතරින් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා සම්බන්ධ ප්‍රකාශයන් සඳහන් පිළිතුර තෝරන්න.
A. පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම.
B. මහාබෝධි සඟරාවට ලිපි සැපයීම.
C. අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය දීම.
D. වෙසක් පොහොය දින රජයේ නිවාඩු දිනයක් බවට පත්කරලීම.

(1) B සහ C (2) A සහ B (3) A සහ D (4) C සහ D

28. පොන්නම්බලම් අරුණාචලම් මහතා හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය ඇතුළත් පිළිතුර කුමක්ද ?
(1) හින්දු ආගමික පුනරුදය මෙහෙයවීම.
(2) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වීම.
(3) සිංහල නායකයන් සමඟ එකතු වී ලාංකිකයන්ට දේශපාලන බලතල ලබා ගැනීමට කටයුතු කිරීම.
(4) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කථානායකවරයා වීම.

29. මෙරට ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ කටයුතු සාර්ථක කර ගැනීමට කැප වී කටයුතු කළ ඊජිප්තු ජාතිකයා කවරෙක්ද ?
(1) සිද්ධි ලෙබ්බේ මහතා (2) ඔරාබි පාෂාතුමා
(3) අබු බකර් මහතා (4) ටී. බී. ජයා මහතා

- **ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් 29 සහ 30 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. පළාත් බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
B. නාමික විධායක ජනාධිපති තනතුර ඇති කිරීම.
C. අග්‍රාණ්ඩුකාර තනතුර ස්ථාපනය කිරීම.
D. ජාතික රාජ්‍ය සභාව පිහිටුවීම.
E. ව්‍යවස්ථාදායක සභාවේ මුල්වරට නිල නොලත් බහුතරයක් ඇතිවීම.

30. මැනිං ආණ්ඩුක්‍රමය හා සම්බන්ධ යෝජනා දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) A සහ E (2) C සහ D (3) D සහ E (4) A සහ B

31. 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ යෝජනා දැක්වෙන පිළිතුර කුමක්ද ?
(1) B සහ D (2) B සහ C (3) A සහ E (4) B සහ E

32. මෙරට කොළඹ මහනුවර දුම්රිය මාර්ගය ඉදි කළේ කුමන ආණ්ඩුකාරවරයාගේ කාලයේ දී ද ?
(1) හෙන්රි වෝඩ් (2) එඩ්වඩ් බාන්ස්
(3) හර්කියුලිස් රොබින්සන් (4) විලියම් ග්‍රෙගරි

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

ඉතාලියේ ප්‍රසිද්ධ මානවවාදී ගත් කතුවරයකු වූ අලගියරි ඩාන්ටේ විසින් රචනා කළ කාව්‍ය ග්‍රන්ථය කුමක්ද ?

(1) ඩිවිනා කොමඩියා (2) ලෝරාට සැහැලි කවි
(3) ඩී. කැමරන් (4) කුමාරයා

- නාවික විද්‍යාලයක් පවත්වාගෙන යාම.
- නාවික ශිල්පය, සිතියම් විද්‍යාව, තාරකා ශාස්ත්‍රය වැනි විෂයන් එහි ඉගැන්වීම.

ඉහත කාර්යයන් සඳහා සම්බන්ධ නාවුක කටයුතුවලට අනුග්‍රහය දැක්වූ පුද්ගලයා කවුද ?

(1) ලොරෙන්සෝ ද අල්මේදා (2) වස්කෝ ද ගාමා
(3) නාවික හෙන්රි (4) පර්ඩිනන්ඩ්

කාර්මික විප්ලවය හා සම්බන්ධ පහත සඳහන් සොයාගැනීම්, අදාළ නිර්මාණකරුවා සමග ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. ජෙනී යන්ත්‍රය | A. හම්ප්‍රිඩේවි |
| 2. මියුල් යන්ත්‍රය | B. රොබට් පුල්ටන් |
| 3. ආරක්‍ෂක ලාම්පුව | C. ජේම්ස් හාග්‍රීව්ස් |
| 4. දුම් බෝට්ටුව | D. සැමුවෙල් ක්‍රොම්ප්ටන් |

(1) D,C,B,A (2) C,D,A,B (3) B,D,C,A (4) C,A,D,B

19 වන සියවසේ දී කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ රටවල් කාණ්ඩයට අයත් වන පිළිතුර කුමක් ද?

(1) ප්‍රංශය, ජර්මනිය, බෙල්ජියම, ස්පාඤ්ඤය, ජපානය
(2) ජර්මනිය, ඕලන්දය, ප්‍රංශය, බෙල්ජියම, ස්විස්ටර්ලන්තය
(3) බෙල්ජියම, ඕලන්දය, චීනය, ප්‍රෂියාව, හංගේරියාව
(4) ප්‍රංශය, බෙල්ජියම, ඔස්ට්‍රියාව, හංගේරියාව, ප්‍රෂියාව

කාර්මික විප්ලව සමයේ මැකඩම් ක්‍රමය භාවිත කරන ලද්දේ.

(1) පාලම් ඉදිකිරීමට ය. (2) දුම්රිය මාර්ග තැනීමට ය.
(3) යකඩ හා වානේ නිපදවීමට ය. (4) මහාමාර්ග තැනීමට ය.

**පහත A, B, C, D වලින් දැක්වෙන ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 37 සිට 39 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. 1. බටහිර ජාතීන් ලංකාවට පැමිණීම
   2. ලංකාවේ පිහිටීම

B. 1. සර්ව ජන ඡන්ද බලය
   2. ජෝන් ඩොයිලි

C. 1. කෝපි වගාව
   2. හෙමිලියා වෙස්ටර්ට්‍රික්ස්

D. 1. විශ්වය පිළිබඳ සොයාගැනීම්
   2. විද්‍යාවේ දියුණුව

දෙවැන්න නිසා පළමුවැන්න සම්පූර්ණයෙන්ම අසාර්ථක වීම පෙන්නුම් කරන ප්‍රකාශ /පද යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D

පළමුවැන්න ධනාත්මක ලෙස සිදුවීමට දෙවැන්න අතිශයින් හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ / පද යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D

දෙවැන්න හා පළමුවැන්න අතර කිසිම සම්බන්ධයක් නොපෙන්වන ප්‍රකාශ / පද යුගලය කුමක්ද ?

(1) A (2) B (3) C (4) D



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

...ghts Reserved

**Royal College - Colombo 07**

**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

| 33 | S | II |
|---|---|---|

***Grade 11 – Second Term Test – October 2023***

කාලය : පැය 3
Time: 3 hours

දෙවන වාර පරීක්ෂණය - 2023 - ඔක්තෝබර් - 11 ශ්‍රේණිය

# ඉතිහාසය - II

... - ........................................................................ Class: -................ Index no: - ........................

...කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.

...කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.

...පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

...) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

දැදුරු ඔය, යෝධ වැව, මිනිහාගල්කන්ද, ගාල්ල, පොළොන්නරුව, කෝනේශ්වරම්, මහනුවර, මැණික් ගඟ, යාපනය, කැළණිය, හලාවත , නාච්චදූව වැව (ල. 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

ස්පාඤ්ඤය, මලයා අර්ධද්වීපය, අරාබි මුහුද, මදුරාසිය, රෝමය, චීනය (ල. 6)

...) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - පනාකඩුව තඹ සන්නසින් කියවෙන රජතුමා කවරෙක්ද ?

B - මෙරට ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දුන් රජතුමා කවුද ?

C - පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමේ ප්‍රථම නැව් කණ්ඩායම වෙළඳ කටයුතු ආරම්භ කළ ප්‍රදේශය නම් කරන්න.

D - ක්‍රි.ව. 1912 දී පැවති මැතිවරණයෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වූ ප්‍රථම උගත් ශ්‍රී ලාංකිකයා කවරෙක්ද ? (ලකුණු 4)

...හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ ...තුරු පත්‍රයේ ලියන්න.

A



(1) A අක්ෂරයෙන් පෙන්වන පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

(2) මෙය පිහිටි ප්‍රදේශයේ නම ලියන්න.

(3) මෙය අයත්වන්නේ කුමන ඓතිහාසික යුගයට ද?

(4) මේවා භාවිත කර ඇත්තේ කවුරුන්ද ? (ලකුණු 4)

B



(1) මෙහි දැක්වෙන පුද්ගලයා කවරෙක්ද ?

(2) මොහු කුමන රටක පාලකයෙක් ද ?

(3) ඔහු ආරක්ෂාව වෙනුවෙන් පළා ගිය රට කුමක්ද ?

4) මෙම අවධිය වන විට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පාලනය ගෙනගිය ලන්දේසි ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 4)

## II කොටස

12. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පරිසර කලාප තුනක් සඳහන් කරන්න. (ල. 3)

(ii) A. ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිත කළ පාෂාණ වර්ග 2ක් ද
B. එම මෙවලම් භාවිත කර කරන ලද කාර්යයන් දෙකක් ද සඳහන් කරන්න. (ල. 4)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජීවන රටාවේ සිදු වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

3. (i) පහත A, B, C යටතේ දැක්වෙන රජවරුන්ගෙන් පසුව රාජ්‍යත්වයට පත් වූ අය පිළිවෙළින් නම් කරන්න.

A. කාවන්තිස්ස රජතුමා
B. වසභ රජතුමා
C. ධාතුසේන රජතුමා (ල. 3)

(ii) පැරණි සෙල්ලිපිවල සඳහන් පරිදි පහත සඳහන් නිලධාරීන් අතීතයේ දී හැඳින්වූ ආකාරය පිළිවෙළින් ලියන්න.

A. සේනාපතිවරු
B. චත්සිරිත් හා චාරිත්‍ර පිළිබඳ අධිකාරී
C. නගර පරිපාලක
D. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී (ල. 4)

(iii) අතීත රජවරුන්ගේ ක්‍රියාකලාපය සහ පෙනී සිටීමට උත්සාහ කළ ස්වරූපය අනුව රාජ්‍යත්වය පිළිබඳ ගොඩනැගී තිබූ සංකල්ප දෙකක් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ සේවාවන් තුනක් විස්තර කරන්න. (ල. 6)

(i) පහත A, B, C යටතේ දක්වා ඇති වැව් ඉදිකර ඇත්තේ කුමන ගංගා ආශ්‍රිතව දැයි අනුපිළිවෙළින් ලියන්න.

A. නුවරළු වැව
B. පදවිය වැව
C. කලා වැව (ල. 3)

(ii) පහත A, B, C, D යටතේ දක්වා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A. මින්නේරිය සහ කවුඩුල්ල යන වැව්වලට ජලය ගෙන යන ඇළ මාර්ගය
B. ලංකා ඉතිහාසයේ ප්‍රථමවරට වැවක් සෑදූ පාලකයා
C. තුඩා චෛත්‍යයන්හි ආරක්ෂාවට සාදන ලද නිර්මාණය
D. පුරාණ යකඩ නිස්සාරණය පිළිබඳව තොරතුරු ලබාදෙන සබරගමු පළාතට අයත් ප්‍රදේශය (ල. 4)

i) අතීතයේ ගම් වැව් පද්ධති ඉදිකිරීමේ අරමුණු දෙක කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

) අතීතයේ මෙරට වාරි ශිල්පීන් වැව් බැම්මේ ශක්තිමත් බව හා ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල. 6)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

(i) විජයබා කොල්ලය හා සම්බන්ධ වූ කුමාරවරුන් තිදෙනා නම් කරන්න. (ල. 3)

(ii) පහත දැක්වෙන කරුණුවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. අවුස්ත්‍රියාවේ දොන් ජුවාන් නමින් බෞතීස්ම ලැබූ පුද්ගලයා

B. තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරූ රජතුමා

C. නායක්කර් රාජවංශයේ ආරම්භක පාලකයා

D. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඇතුළු පිරිස ඉංග්‍රීසීන් විසින් පිටුවහල් කළ ප්‍රදේශය

(ඇසෑමය, වෙල්ලෝරය, යමසිංහ බණ්ඩාර, කොනප්පු බණ්ඩාර, VII වන බුවනෙකබාහු, ධර්මපාල, ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ) (ල. 4)

(iii) උඩරට රාජ්‍යයේ ආර්ථික රටාවේ ලක්‍ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) ක්‍රි.ව. 1818 ප්‍රථම නිදහස් අරගලය ඇතිවීමට බලපෑ හේතු තුනක් විස්තර කරන්න. (ල. 6)

(i) පහත A, B, C හි දැක්වෙන දේශපාලන පක්‍ෂවල ආරම්භක නායකයින් අනුපිළිවෙළින් නම් කරන්න.

A. ලංකා කොමියුනිස්ට් පක්‍ෂය

B. එක්සත් ජාතික පක්‍ෂය

C. ෆෙඩරල් පක්‍ෂය (ල. 3)

(ii) A. යටත් විජිත භාර මහලේකම්වරයා විසින් කෝල්බෲක් කොමිසම එවීමට බලපෑ සාධකයක් ලියන්න.

B. ආණ්ඩුකාරවරයාගේ බලතල අඩුකිරීම පිණිස කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ යෝජනාව කුමක්ද ? (ල. 4)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්‍ෂණ දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) A. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කර ඇති මූලික මිනිස් අයිතිවාසිකම් හතරක් නම් කරන්න.

B. එම මූලික අයිතිවාසිකම් කඩ වූ විට ඒ සඳහා ගත හැකි නීත්‍යානුකූල ක්‍රියාමාර්ග දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ල. 6)

(i) පහත A, B, C හි දැක්වෙන වාණිජ බෝග වලට අදාළ ප්‍රධාන පර්යේෂණායතන පිහිටා ඇති ස්ථාන අනුපිළිවෙළින් නම් කරන්න.

A. තේ

B. රබර්

C. පොල් (ල. 3)

(ii) පහත සඳහන් කරුණු වලට අදාල පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A. කෝපිවලට අය කළ අපනයන බද්ද අඩු කළ ආණ්ඩුකාරවරයා.

B. ක්‍රි.ව. 1842 දී බැප්ටිස්ට් සමාගම විසින් මුද්‍රණය කළ ප්‍රකාශනයේ නම

C. තම නාට්‍ය මගින් මධ්‍යසාර භාවිතයේ අහිසි විපාක පැහැදිලි කිරීම.

D. වතු කම්කරුවන්ට නායකත්වය දීම. (ල. 4)

(iii) බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරට තේ වගාවේ දියුණුවට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ල. 5)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරට සිදු වූ සමාජමය වෙනස්කම් තුනක් සැකෙවින් විස්තර කරන්න. (ල. 6)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

## III කොටස

08. (i) මධ්‍යතන යුගයේ දී යුරෝපා වෙළඳ කටයුතුවල දී කැපී පෙනුණ මධ්‍යධරණී මුහුද ආශ්‍රිත නගර තුනක් නම් කරන්න. (ල. 3)

(ii) A. නූතන තාරකා විද්‍යාවේ පියා
B. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා බව සොයා ගැනීම.
C. අවසාන විනිශ්චය නම් චිත්‍රය ඇඳීම.
D. ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු ද ඒවාට ප්‍රතිකර්ම ද අත්හදා බැලීම.

ඉහත කරුණුවලට අදාළ පුද්ගලයන් කවුරුන්දැයි පිළිවෙළින් නම් කරන්න. (ල. 4)

(iii) A. දේශ ගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූ සාගරබද රටවල් දෙකක් නම් කරන්න.
B. දේශ ගවේෂණයේ ප්‍රතිඵල තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(iv) පුනරුද සමයේ පහත සඳහන් කලාශිල්ප ක්ෂේත්‍රයන්හි සිදු වූ වෙනස්කම් නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.
- චිත්‍ර කලාව
- ප්‍රතිමා කලාව
- ගෘහ නිර්මාණ ශිල්පය (ල. 6)

09. (i) A. කාර්මික විප්ලවය යුරෝපයෙන් ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුව ද
B. බ්‍රිතාන්‍ය හැරුනු විට 18 වන සියවස වන විට යටත් විජිත පිහිටුවා ගත් වෙනත් යුරෝපා රටවල් දෙකක් ද පිළිවෙළින් ලියන්න. (ල. 3)

(ii) කාර්මික විප්ලව සමයේ දී නිපදවූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. එයට සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.
A. යපස් උණුකිරීමට විදුලි උඳුන
B. මෝටර් රථය
C. ගුවන් විදුලි යන්ත්‍රය
D. අශ්වයන් බඳින ලද නගුල්වලින් පේළියට වැපිරීමේ ක්‍රමය.
(ඩෙම්ලර්, රොබට් පුල්ටන්, සැමුවෙල් මෝස්, ගුග්ලි මාර්කෝනි, හම්ප්‍රිඩේවි, රොබට් බැක්වෙල්, ජෙත් රෝටල්, විලියම් සීමන්ස්) (ල. 4)

(iii) කාර්මික විප්ලව සමයේ එංගලන්තයේ පේශ කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) කාර්මික විප්ලවයේ බලපෑමේ ප්‍රතිඵල වශයෙන් යුරෝපයේ දේශපාලන, ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයන්හි ඇති වූ වෙනස්කම් එක බැගින් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 6)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner